ශ්‍රී ලාංකික සිංහල සමාජය තුළ සාහිත්‍ය නිර්මාණ කාර්යයෙහිලා කාන්තාවගේ දායකත්වය එක් එක් යුගවල අඩුවැඩි වශයෙන් ලැබුණ බව පැහැදිලි කරුණකි. අතීත සමයන් පිළිබඳ වැඩි තොරතුරු සොයාගත නොහැකි වුවද මාතර අවදිය තුළ සාහිත්‍ය කරණයෙහිලා පෙරමුණ ගත් ලේඛිකාවන් සිටි බවට නොමඳ සාක්ෂි ඇත. විශේෂයෙන්ම ගජමන් නෝනාගේ නාමය ඒ අතර මුල්තැන ගනියි. ඉන් පසුව සාහිත්‍යයේ වර්ධනය සිදු වෙමින් පැවතෙද්දී කිවිඳියන් ලෙස මොනිකා රුවන්පතිරණ පිළිබඳ මතකය අදත් අප අතර නොමැකී පවතී.






# 'විශ්ව සාහිත්‍ය ක්ෂේත්‍රය ඒකාලෝක කළ ලේඛිකාවෝ'



සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

"කැසගිනි රෝ දුක් ගිනි වැද
මියගොස් නැති නුඹ දුටු සඳ
එම දායාදය සොයමින්
ඔහු නුඹ පසුපස එනු ඇත"

**('පුතුට කවියක්' . අංගුලිමාලගේ සිහින පද්‍ය සංග්‍රහය, 1974)**

"සකුන්තලා බිසව එදා තම පුතු ගැන
කියමින්නේ
රජු ළඟ වැළපුණු මොහොතේ පිහිට ලැබුණි
දෙවියන්නේ
මොන දෙවියන්දැයි පුතුනේ අද උඹෙ සරණොට
එන්නේ
පිබිද වහා උඹම හඬා උඹෙ පැමිණිලි
කියපන්නේ"

**(ඔබෙ යෙහෙළිය . ඇය ගැහැණිය, 1975)**

ගැහැනියට සමාජය තුළ අත් වූ අවාසනාවන්ත ඉරණම කෙරෙහි දැඩි අවධානයකින් යුතුව කවි රචනා කළ ලේඛිකාවක් වශයෙන් මොනිකා රුවන්පතිරණ සිංහල සාහිත්‍යයට අදාළ ලේඛිකා පරපුරේ වැදගත් තැනක් හිමි කරගනියි.

ශ්‍රී ලාංකික ලේඛිකාවන්ගේ සංඛ්‍යාව අද වන විට එදාට වඩා වැඩි වෙමින් පවතින අයුරු දැකගත හැකිය. විශේෂයෙන්ම නවකතා, කෙටිකතා ක්ෂේත්‍රයන්හි කාන්තා දායකත්වය අද පුළුල් වෙමින් පවතී. විශ්ව සාහිත්‍යය පොදුවේ සැලකිල්ලට ගත් විට සිංහල සාහිත්‍යය මෙන්ම එම සාහිත්‍යය යම් තරමකට හෝ පෝෂණය කළ ලේඛිකාවන් පිළිබඳ තොරතුරු මෙරටට පමණක් සීමා වී තිබීම ඛේදජනක තත්වයකි.

කරුණු මෙසේ වුවද විශ්ව සාහිත්‍යය ගැන සලකා බලන විට එහි නම් දරා සිටින ලේඛිකාවෝ අනල්පය. එංගලන්තය ඇමෙරිකාව වැනි රටවල් මෙන්ම ඉන්දියාව ද විවිධ යුගවලදී ලේඛිකාවන් බිහි කළ රටවල් ලෙස ගත හැකිය. ඊට අමතරව ලොව අන් බොහෝ රටවල සාහිත්‍යය පිළිබඳව සොයා බලද්දී විවිධ ලේඛිකාවන් ගැන තොරතුරු දැනගන්නට ඇත. මෑතකදී විශ්ව සමාජය තුළම විශාල වශයෙන් පාඨක රුචිය වර්ධනය කළ, 'හැරී පොටර්' කතා පෙළ රචනා කළ ලේඛිකාව මුලදී සිය අනන්‍යතාව හෙළි නොකර සිටි නමුදු මේ වන විට 'හැරී පොටර්' කතා කියවන්නන් ඇයගේ සැබෑ නම ආදිය හඳුනාගෙන ඇත. ජෝඈන් රෝලිං නම් වූ මෙම කතුවරිය පළමුව පෙනී සිටියේ ජේ. කේ. රෝලිං යන නමින් සහ රොබට් ගැල්බ්‍රේත් යන අන්වර්ථ නාමවලිනි. බ්‍රිතාන්‍ය ජාතික නවකතා කතුවරියක වන ඇය උපත ලැබුවේ 1965 වර්ෂයේ ජූලි මස 31 වන දාය. 'ජෝ රෝලිං' නමින් ද හඳුන්වනු ලැබෙන මෙම කතුවරිය වඩාත් ප්‍රචලිත වූයේ 'හැරී පොටර්' නමින් රචිත මනඃකල්පිත කථා මාලාවේ කතුවරිය ලෙසිනි. ලොව පුරා අවධානයට ලක් වී ඇති මෙම කථා මාලාව වෙනුවෙන් සම්මාන පිට සම්මාන ඇයට හිමි වී ඇත. තම පොත්වල පිටපත් මිලියන හාරසියයකට අධික සංඛ්‍යාවක් අලෙවි කරගැනීමේ භාග්‍යය ද ඇයට උදා විය.

ඉතිහාසය පුරාම බලන විට වඩාත්ම අලෙවි වූ කථා මාලාව 'හැරී පොටර්' බවට සාක්ෂි ලැබී ඇත. එපමණක් නොව එම කථා පෙළට ලැබුණ අධික ප්‍රේක්ෂක කැමැත්ත හේතු කොටගෙන එම කෘති අළලා චිත්‍රපට ද නිර්මාණය විය. චිත්‍රපට සම්බන්ධයෙන් ද ඒ හා සමාන වාර්තා පිහිටුවීමට හැකි වී ඇත.

2004 වර්ෂයේදී, පොත් ලිවීමෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන ගණනින් ආදායම ලත් ලේඛිකාවක් ලෙස ද ඇය හඳුන්වනු ලැබුවාය. ලොව ධනවතුන් අතර 1062 වන තැන හිමි කරගන්නා ජෝඈන් රෝලිං ලෝකයේ ජනතාවට රස දනවන කෘති නිර්මාණය කළ කාන්තාවන් අතුරින් දෙවැනි ධනවත් ගැහැනිය ලෙස ද හඳුන්වනු ලැබ ඇත. වසර 1997 සිට 2007 දක්වා කාලය තුළ හැරී පොටර් කථා මාලාවේ කොටස් හතක්ම ඇය විසින් රචනා කෙරිණ. ලොව පුරා විශ්වවිද්‍යාල හයකින් ගෞරව උපාධි හිමි කරගෙන සිටින ඇය ඊට අමතරව ප්‍රංශ ජනාධිපතිවරයා විසින් ඇය නම්බු නාමයකින් ද පුදනු ලැබුවාය.

කාන්තාවන් ලේඛන කාර්යයෙහි නියැලීම එදා සිට මේ දක්වාම විවිධ රටවල අඩුවැඩි වශයෙන් සිදු වූ බව පෙනේ. ජපානය වැනි රටක් ගැන බලන විට ලොව දීර්ඝතම නවකතාව වන 'ගෙංජි මොනොගතරි' රචනා කළේ 'ෂිකිබු ආර්යාව' විසින් බව සඳහන් වේ. මෙහි පෙනෙන එක් කරුණක් නම් එකල පොතපත ලිවීමට යොමු වී ඇත්තේ සාමාන්‍ය ජනතාව අතර විසූ කාන්තාවන් නොව ප්‍රභූ කාන්තාවන් බවය. ඒ හැරුණ විට මේ දක්වා ජපානය තුළ ද ලේඛිකාවෝ බහුල වශයෙන් බිහි වී ඇත්තාහ.

කැනඩාවේ සාහිත්‍යය පෝෂණය කිරීමට දායක වූ කැනේඩියානු ලේඛිකාවක් ලෙස මාග්‍රට් ඇට්වුඩ් හඳුන්වා දිය හැකිය. ඇය අතින් රචිත නවකතා සංඛ්‍යාව නවයක් පමණ වන බව සඳහන් වන අතර 1969 වසරේ සිට 2000 වර්ෂය දක්වා ප්‍රකාශයට පත් වූ එම නවකතා අතුරෙන් ලෝකප්‍රකට 'බුකර් ත්‍යාගය' සහ 'ගිලර් ත්‍යාගය' ද ඇයගේ කෘති දෙකකට හිමි වී ඇත. ඒ හැරුණ විට, ඇය විසින් රචිත සෙසු නවකතා සියල්ලම පාහේ විවිධ ත්‍යාග හා සම්මාන සඳහා නිර්දේශිත කෘතිවලට එක් වී ඇත. 1969 වසරේදී 'ද එඩිබල් වුමන්' නමින් පළ වූ නවකතාවේ සිට 2000 වසරේදී පළ වූ 'ද බ්ලයින්ඩ් ඇසසින්' නම් වූ නවකතාව දක්වා ඇය අතින් රචිත නවකතා නවයක් වන බවට සාක්ෂි ලැබේ.

වසර 1939 නොවැම්බර් 18 දා උපත ලද මාග්‍රට් ඇට්වුඩ් කිවිඳියක්, නවකතා කතුවරියක්, සාහිත්‍ය විචාරකයෙක්, ලිපි ලේඛන ප්‍රකාශයට පත් කළ විද්වත් කාන්තාවක් ලෙස පමණක් නොව පරිසරය පිළිබඳ ක්‍රියාශීලී ලෙස අවධානය යොමු කළ තැනැත්තියක් ලෙස ද හඳුනාගත හැකිය. කැනඩාව තුළ ලේඛිකාවක් ලෙස ක්‍රියාශීලී මෙහෙවරක යෙදුණු එතුමිය 'ග්‍රිෆින්' පද්‍ය සම්මාන මණ්ඩලයේ මුල්ම භාරකාරවරියක් ද වූවාය. මෙලෙසින් විවිධ සාහිත්‍ය මාධ්‍යයන්හි කුසලතා පෑ ඇට්වුඩ් මහත්මිය වඩාත් ප්‍රසිද්ධියක් උසුලනු ලබන්නේ නවකතා කතෘවරියක ලෙසිනි. ඇය විවිධ නව සොයාගැනීම් කෙරෙහි දක්වන උනන්දුව ද සැලකිය යුතු තරම්ය. මේ අයුරින් ලෝක කාන්තා ප්‍රජාව අතර දක්ෂ ලේඛිකාවක් ලෙස ඇට්වුඩ් මහත්මිය නම් දරා සිටින්නියකි.

ඇමෙරිකානු සාහිත්‍යය තුළ ද ලේඛිකාවන්ගේ නම් බෙහෙවින් ප්‍රසිද්ධියට පත් වී ඇත. ටෝනි මොරිසන් සහ ජොයිස් කැරල් ඕට්ස් ඒ අය අතුරෙන් ප්‍රකට ලේඛිකාවෝ දෙදෙනෙකි. මැරිලින් රොබින්සන්, ජෙරල්ඩීන් බෲක්ස් නම් වූ ලේඛිකාවෝ ඇමෙරිකානු සාහිත්‍යයට එක් වී සිටින තවත් කතුවරියෝ දෙදෙනෙකි. ඈන් රයිස්, ඇලිස් වෝකර්, ඩයනා ගැබල්ඩන්, උර්සුලා ග්වින්, ඩැනියල් ස්ටීල්, ඈන් ටයිලර්, එලිසබත් ගිල්බර්ට්, ඩොනා ටාට්, ජෝඈන් ඩිඩියන්, නෝරා රොබට්ස් යන අය මෙන්ම ලුවීස් අර්ඩ්රිච් නම් වූ දේශීය ඇමෙරිකානු (මුල් ඇමෙරිකානු) ලේඛිකාව ද ඇමෙරිකානු සාහිත්‍යය පෝෂණය කරමින් ප්‍රසිද්ධිය ඉසිලූ කතුවරියෝ වෙති.

ඇමෙරිකානු සාහිත්‍යය පිළිබඳව උනන්දුවක් දක්වන විද්‍යාර්ථීන් මෙන්ම විද්වතුන් ද විශේෂ අවධානයකින් සලකා බලන ලේඛිකාවන් තිදෙනකු ලෙස ඉහත සඳහන් කළ ජොයිස් කැරල් ඕට්ස්, ටෝනි මොරිසන් සහ ඇලිස් වෝකර් ද හඳුන්වා දිය හැකිය. ඒ සමගම ඈන් රයිස් ලේඛිකාව ද ජනතාව අතර ප්‍රසිද්ධියක් උසුලන තවත් ඇමෙරිකානු කතෘවරියකි.

වසර 1938 ජූනි මස 16 දා මෙලොව උපත ලද ජොයිස් කැරල් ඕට්ස්, තම පළමු කෘතිය ප්‍රකාශයට පත් කළේ 1963 වර්ෂයේදීය. එදා මෙදාතුර ඇය විසින් රචනා කොට ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති කෘති හතළිහක් පමණ වෙයි. නවකතා රචනයට අමතරව මෙම ලේඛිකාව කෙටි නවකතා සහ නාට්‍ය කෘති ද ගණනාවක්ම ලියා පළ කර ඇත. ප්‍රබන්ධ නොවන වෙනත් කෘතීන් රාශියක් ලිවීමට ද යොමු වූ මෙම කතෘවරිය කෙටිකතා සංග්‍රහ විශාල සංඛ්‍යාවක් සහ පද්‍ය කෘති සමූහයක් ද පාඨකයාට දායාද කොට ඇත. ලේඛන කලාවට විශේෂ රුචියක් දක්වන ජොයිස් දිනපතා දීර්ඝ වේලාවක් තිස්සේ තමා ලිවීමේ නිරතව සිටින බව පවසා ඇත. ලිවීම සඳහා ඇය දක්වන උනන්දුවෙහි ප්‍රතිඵල වශයෙන් ඇය අතින් නවකතා රැසක් ප්‍රකාශයට පත් වී තිබීම පුදුමයක් නොවේ. වෑන්ගාඩ් ප්‍රකාශකයන් විසින් 1964 දී ඇයගේ ප්‍රථම නවකතාව වන 'ෂඩරින් ෆෝල්' පළ කළ අතර ඒ වන විට ඇය විසිහය හැවිරිදි තරුණියක්ව සිටියාය. එයින් වසර දෙකකට පසුව ඇයගේ 'වෙයා ආ යූ ගොයින්, වෙයා හෑව් යූ බීන්?' නම් වූ කෘතිය ප්‍රකාශයට පත් විය. මෙය කෙටිකතා සංග්‍රහයක් වූ අතර එහි විශේෂත්වය වූයේ එවකට ප්‍රකටව සිටි 'බොබ් ඩිලන්' නමැති ගායකයා ගැයූ, 'ඉට්ස් ඕල් ඔවර් නව්, බේබි බ්ලූ' නමැති ජනප්‍රිය ගීතය ශ්‍රවණය කිරීමෙන් පසු එම කෙටිකතා සංග්‍රහය ලියා පළ කිරීමයි.

**එංගලන්තය ඇමෙරිකාව වැනි රටවල් මෙන්ම ඉන්දියාව ද විවිධ යුගවලදී ලේඛිකාවන් බිහි කළ රටවල් ලෙස ගත හැකිය. ඊට අමතරව ලොව අන් බොහෝ රටවල සාහිත්‍යය පිළිබඳව සොයා බලද්දී විවිධ ලේඛිකාවන් ගැන තොරතුරු දැනගන්නට ඇත.**